# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

නිවාඩු කාලීන පැවරුම්

සැකසුම-මාවනැල්ල අධ්‍යාපන කලාපය

## 5 ශ්‍රේණිය - පරිසරය ( නොවැම්බර්-3 සතිය )

### 15 තේමාව - මිනිසා සහ තොරතුරු

❖ ක්‍රියාකාරකම 1

පුතාලා දන්නවාද තොරතුරු සන්නිවේදනය පිළිබඳව තොරතුරු යනු අන් අයට දැනගත හැකි පරිදි ප්‍රකාශ කරන ප්‍රවෘත්තියකි. සන්නිවේදනය යනු යමක් හොඳින් ප්‍රකාශ කිරීම නැතහොත් නිවේදනය කිරීමයි. අතීතයේ සිට වර්තමානය දක්වා මිනිසා භාවිතා කළ තොරතුරු සන්නිවේදන ක්‍රම පිළිබඳව වැඩිහිටියන් සමඟ සාකච්ඡා කර තොරතුරු රැස්කරන්න. (රූපසටහන්, ඡායාරූප, පොත්, පත්තර වලින් සොයාගන්න.)

❖ ක්‍රියාකාරකම 2.

ඔබේ නිවසට ගෙනෙන ලද ආහාර ඇසුරුම් ඖෂධ ඇසුරුම් හා සම්බන්ධ වෙළඳ දැන්වීම්, ගුවන්විදුලි රූපවාහිනී යන්ත්‍ර වැනි ගෙදර දොර පරිහරණය කරන විවිධ උපකරණ මිලට ගැනීමේ දී දෙනු ලබන උපදෙස් පත්‍රිකා හැකිතරම් එකතු කරන්න. ඒවායේ ඇති උපදෙස් මොනවාද යන්න හොඳින් කියවන්න.

❖ ක්‍රියාකාරකම 3.

පුතේ ඔබේ නිවසේ හෝ අවට ඇති අනාරක්ෂිත ස්ථාන හඳුනාගන්න. එම ස්ථානවලදී අනතුරු සිදුවීමට පුළුවන. එම ස්ථානවලින් යාමේ දී ප්‍රවේශම් වීම සඳහා ඒ පිළිබඳව අනෙක් අයට දැන්වීමට ගතයුතු පියවර විස්තර කෙරෙන පත්‍රිකාවක් සාදන්න. හැකිනම් සංකේත මගින් හෝ සංඥා සහිතව සකස් කරන්න.

- අප තොරතුරු ලබාගන්නා මාධ්‍ය වර්ග කර ලියන්න.
  (මුද්‍රිත මාධ්‍ය හා විද්‍යුත් මාධ්‍ය වශයෙන්
  නිදසුන් :- පුවත්පත මුද්‍රිත මාධ්‍යයක් වන අතර ගුවන්විදුලිය විද්‍යුත් මාධ්‍යයකි.)



